November 28, 2016

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ තරුණ සාමාජික සන්සදය (YMS) ප්‍රථම රැස්වීම

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ තරුණ සාමාජික සන්සදයේ (YMS) 2016/17 සැසිවාරය සඳහා වන ප්‍රථම රැස්වීම එම සන්සදයයේ සභාපති ඉංජිනේරු දයාන් හේරත් මහතාගේ මූලිකත්වයෙන් 2016 නොවැම්බර් 27වන දින පෙ.ව..9.30ට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ විමලසුරේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පවත්වනලද අතර මේ සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපති ඉංජිනේරු ජයවිලාල් මීගොඩ මැතිඳුන් තරුණ සාමාජික සන්සදයේ ගරු අනුශාසක මෙන්ම ආරාධිත දේශකයකු ලෙසද සහභාගි වන ලදි.

තරුණ සාමාජිකයන් අතර සබඳතා වර්ධනය සහ ඉදිරි වසර සඳහා කළයුතු කාර්යයන් තීරණය කිරීම මෙහි ප්‍රධාන පරමාර්ථයවිය. ප්‍රථම රැස්වීම සඳහා ආයතනයේ සියළුම සාමාජිකයන් නියෝජනය කරමින් සාමාජිකයන් 80කට ආසන්න ප්‍රමාණයක් සහභාගි විය.

සාම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව ඉංජිනේරු නිශාන්ත කමලදාස මැතිතුමන් විසින් තරුණ ඉංජිනේරුවන්ගේ කුසලතා වර්ධනය මැයින් දේශනයක් පවත්වන ලදි.
දිවා ආහාරයෙන් අනතුරුව ප්‍රථම රැස්වීම පවත්වන ලදී. තරුණ සාමාජික ඒකකයේ සභාපතිතුමන් තමන්ගේ ඉදිරි අරමුණු පැහැදිළි කිරීමෙන් අනතුරුව නව කමිටුව තෝරාපත්කරගන්නා ලදි. ශිෂ්‍යය සාමාජිකයන් විසින් තමන්ගේ ඉදිරි වැඩ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් අපේක්ෂා කරන දෑ ඉදිරිපත් කරන ලදී.

අවසානයේ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපති ඉංජිනේරු ජයවිලාල් මීගොඩ මැතිඳුන් විසින් "තරුණ ඉංජිනේරුවන්ගේ සමාජ වගකීම් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය" මැයින් ආරාධිත දේශනයක් ඉදිරිපත් කරනලදි.

YOUNG MEMBERS SECTION – 2016/2017
THE INSTITUTE OF ENGINEERS IN SRI LANKA